(අටවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 139.]

# පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

**2017 ජනවාරි මස 09 වැනි සඳුදා පූ. භා. 9.30 ට**

## පැමිණි මන්ත්‍රීන් :

ගරු **කරු ජයසූරිය මහතා,** කථානායකතුමා

ගරු **තිලංග සුමතිපාල මහතා,** නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභාපතිතුමා

ගරු **සෙල්වම් අඩෛක්කලනාදන් මහතා,** නියෝජ්‍ය කාරක සභාපතිතුමා

---

ගරු **රනිල් වික්‍රමසිංහ මහතා,** අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා

ගරු **තලතා අතුකෝරල මහත්මිය,** විදේශ රැකියා අමාත්‍යතුමිය

ගරු **වජිර අබේවර්ධන මහතා,** ස්වදේශ කටයුතු අමාත්‍යතුමා

ගරු **මහින්ද අමරවීර මහතා,** ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා

ගරු **ගයන්ත කරුණාතිලක මහතා,** පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා

ගරු **රවී කරුණානායක මහතා,** මුදල් අමාත්‍යතුමා

ගරු **අකිල විරාජ් කාරියවසම් මහතා,** අධ්‍යාපන අමාත්‍යතුමා

ගරු **ලක්ෂ්මන් කිරිඇල්ල මහතා,** උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා

ගරු **දයාසිරි ජයසේකර මහතා,** ක්‍රීඩා අමාත්‍යතුමා

ගරු **නිමල් සිරිපාල ද සිල්වා මහතා,** ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා

ගරු **දුමින්ද දිසානායක මහතා,** කෘෂිකර්ම අමාත්‍යතුමා

ගරු **නවීන් දිසානායක මහතා,** වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා

ගරු **එස්. බී. දිසානායක මහතා,** සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන අමාත්‍යතුමා

ගරු **එස්. බී. නාවින්න මහතා,** අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා

ගරු **ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා,** විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා

ගරු **රිසාඩ් බදියුදීන් මහතා,** කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා

ගරු **ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා,** රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යතුමා

ගරු **චන්ද්‍රානි බණ්ඩාර මහත්මිය,** කාන්තා හා ළමා කටයුතු අමාත්‍යතුමිය

ගරු **ෆයිසර් මුස්තාපා මහතා,** පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා

ගරු **අනුර ප්‍රියදර්ශන යාපා මහතා,** ආපදා කළමනාකරණ අමාත්‍යතුමා

ගරු **සාගල රත්නායක මහතා,** නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමා

ගරු **පාඨලී චම්පික රණවක මහතා,** මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා,** අධිකරණ අමාත්‍යතුමා සහ බුද්ධශාසන අමාත්‍යතුමා

ගරු **මහින්ද සමරසිංහ මහතා,** නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යතුමා

ගරු **රවුෆ් හකීම් මහතා,** නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යතුමා

ගරු **අබ්දුල් හලීම් මහතා,** තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යතුමා

ගරු **කබීර් හෂීම් මහතා,** රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමා

ගරු **ෆීල්ඩ් මාර්ෂල් සරත් ෆොන්සේකා මහතා,** ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යතුමා

ගරු **ටී. බී. ඒකනායක මහතා,** ඉඩම් රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **පියංකර ජයරත්න මහතා,** පළාත් සභා හා පළාත් පාලන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය,** නගර සැලසුම් හා ජල සම්පාදන රාජ්‍ය අමාත්‍යතුමිය

ගරු **විජයකලා මහේස්වරන් මහත්මිය,** ළමා කටයුතු රාජ්‍ය අමාත්‍යතුමිය

ගරු **වී. එස්. රාධක්‍රිෂ්ණන් මහතා,** අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා,** විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **එම්. එල්. ඒ. එම්. හිස්බුල්ලා මහතා,** පුනරුත්ථාපන හා නැවත පදිංචි කිරීම රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඒ. එච්. එම්. ෆවුසි මහතා,** ජාතික ඒකාබද්ධතා සහ ප්‍රතිසන්ධාන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ලසන්ත අලගියවන්න මහතා,** මහානගර හා බස්නාහිර සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **දුනේෂ් ගන්කන්ද මහතා,** ආපදා කළමනාකරණ නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **සුමේධා ජී. ජයසේන මහත්මිය,** තිරසර සංවර්ධන හා වනජීවී නියෝජ්‍ය අමාත්‍යතුමිය

ගරු **කරුණාරත්න පරණවිතාන මහතා,** පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **සුසන්ත පුංචිනිලමේ මහතා,** රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ලක්ෂ්මන් වසන්ත පෙරේරා මහතා,** වැවිලි කර්මාන්ත නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **රන්ජන් රාමනායක මහතා,** සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඩුලිප් විජේසේකර මහතා,** තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **අමීර් අලි සිහාබ්දීන් මහතා,** ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා

---

ගරු **රෝහිත අබේගුණවර්ධන මහතා**

ගරු **මහින්ද යාපා අබේවර්ධන මහතා**

ගරු **ජේ. සී. අලවතුවල මහතා**

ගරු **ඩලස් අලහප්පෙරුම මහතා**

ගරු **ආනන්ද අලුත්ගමගේ මහතා**

ගරු **මහින්දානන්ද අලුත්ගමගේ මහතා**

ගරු **අ. අරවින්ද් කුමාර් මහතා**

ගරු **ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා**

ගරු **ගීතා සමන්මලී කුමාරසිංහ මහත්මිය**

ගරු **කවීන්දිරන් කෝඩීස්වරන් මහතා**

ගරු **චන්දිම ගමගේ මහතා**

ගරු **උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා**

ගරු **නිහාල් ගලප්පත්ති මහතා**

ගරු **දිනේෂ් ගුණවර්ධන මහතා**

ගරු **බන්දුල ගුණවර්ධන මහතා**

ගරු **පද්ම උදයශාන්ත ගුණසේකර මහතා**

ගරු **එස්. එම්. චන්ද්‍රසේන මහතා**

ගරු **ඩී. වී. චානක මහතා**

ගරු **සිසිර ජයකොඩි මහතා**

ගරු **මලිත් ජයතිලක මහතා**

ගරු **(වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**

ගරු **නලින් බණ්ඩාර ජයමහ මහතා**

ගරු **අනුර සිඩ්නි ජයරත්න මහතා**

ගරු **(වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**

ගරු **ක. තුරෙයිරෙත්නසිංහම් මහතා**

ගරු **සිරිනාල් ද මෙල් මහතා**

ගරු **පියල් නිශාන්ත ද සිල්වා මහතා**

ගරු **ටී. රංජිත් ද සොයිසා මහතා**

ගරු **අනුර දිසානායක මහතා**

ගරු **විමලවීර දිසානායක මහතා**

ගරු  වීරකුමාර දිසානායක මහතා

ගරු  සාලින්ද දිසානායක මහතා

ගරු  ඩග්ලස් දේවානන්ද මහතා

ගරු  මොහොමඩ් නවවි මහතා

ගරු  ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා

ගරු  බුද්ධික පතිරණ මහතා

ගරු  කේ. කේ. පියදාස මහතා

ගරු  සනත් නිශාන්ත පෙරේරා මහතා

ගරු  සුජිත් සංජය පෙරේරා මහතා

ගරු  ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා

ගරු  අශෝක ප්‍රියන්ත මහතා

ගරු  හිරුණිකා ප්‍රේමචන්ද්‍ර මහත්මිය

ගරු  එස්. ප්‍රේමරත්න මහතා

ගරු  තාරක බාලසූරිය මහතා

ගරු  විජිත බේරුගොඩ මහතා

ගරු  එස්. එම්. මරික්කාර් මහතා

ගරු  කේ. කාදර් මස්තාන් මහතා

ගරු  ඉම්රාන් මහරූෆ් මහතා

ගරු  තිලක් මාරපන මහතා

ගරු  (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා

ගරු  එස්. සී. මුතුකුමාරණ මහතා

ගරු  සීනිතම්බි යෝහේස්වරන් මහතා

ගරු  (පූජ්‍ය) අතුරලියේ රතන හිමි

ගරු  සී. බී. රත්නායක මහතා

ගරු  ප්‍රසන්න රණතුංග මහතා

ගරු  ප්‍රසන්න රණවීර මහතා

ගරු  මුජිබුර් රහුමාන් මහතා

ගරු  චමල් රාජපක්ෂ මහතා

ගරු  නාමල් රාජපක්ෂ මහතා

ගරු  අංගජන් රාමනාදන් මහතා

ගරු  ගාමිණී ලොකුගේ මහතා

ගරු  ජානක වක්කුඹුර මහතා

ගරු  පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය

**ගරු (ආචාර්ය) ජයම්පති වික්‍රමරත්න මහතා**

**ගරු ඒ. ඒ. විජේතුංග මහතා**

**ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය**

**ගරු චමින්ද විජේසිරි මහතා**

**ගරු කංචන විජේසේකර මහතා**

**ගරු හේෂාන් විතානගේ මහතා**

**ගරු තේනුක විදානගමගේ මහතා**

**ගරු එස්. වියාලේන්දිරන් මහතා**

**ගරු විමල් වීරවංශ මහතා**

**ගරු කුමාර වෙල්ගම මහතා**

**ගරු එස්. ශ්‍රීතරන් මහතා**

**ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා**

**ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මහත්මිය**

**ගරු ජයන්ත සමරවීර මහතා**

**ගරු සන්දිත් සමරසිංහ මහතා**

**ගරු රාජවරෝදයම් සම්පන්දන් මහතා,** පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා

**ගරු ඊ. සරවනපවන් මහතා**

**ගරු ධර්මලිංගම් සිද්ධාර්ථන් මහතා**

**ගරු අන්නාමලෙයි නඩේසු සිවශක්ති මහතා**

**ගරු එම්. ඒ. සුමන්තිරන් මහතා**

**ගරු මාවෙ සෝ. සේනාධිරාජා මහතා**

**ගරු ශෙහාන් සේමසිංහ මහතා**

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**

**ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා**

**ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා**

**ගරු කනක හේරත් මහතා**

**ගරු විජිත හේරත් මහතා**

ධම්මික දසනායක මහතා, පාර්ලිමේන්තුවේ මහ ලේකම්

නීල් ඉද්දවල මහතා, කාර්ය මණ්ඩල ප්‍රධානී සහ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම්

කුෂානි රෝහණදීර මහත්මිය, සහකාර මහ ලේකම්

ටිකිරි කේ. ජයතිලක මහතා, සහකාර මහ ලේකම්

**කල්තැබීම අනුව පාර්ලිමේන්තුව රැස්විය. කථානායකතුමා මූලාසනාරූඪ විය.**

**1. කථානායකතුමාගේ නිවේදන :** කථානායකතුමා විසින් මතු පළවන නිවේදන කරන ලදී,—

**I**

"ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79 ව්‍යවස්ථාව අනුව 2016 දෙසැම්බර් මස 10 වැනි දින මවිසින් පහත සඳහන් පනත් කෙටුම්පතෙහි සහතිකය සටහන් කරන ලද බව දන්වනු කැමැත්තෙමි."

**II**

"පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (ආචාර්ය) ජයම්පති වික්‍රමරත්න මහතා තමන්ගේ වරප්‍රසාද කඩ වී ඇති බවට 2016 දෙසැම්බර් මස 07 දින පාර්ලිමේන්තුවේදී මතු කරන ලද කරුණු වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට යොමු කිරීම සඳහා යෝජනාවක් ඉදිරිපත් කළ හැකිය."

**III**

"පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු පියල් නිශාන්ත ද සිල්වා මහතා තමන්ගේ වරප්‍රසාද කඩ වී ඇති බවට 2016 ජුනි මස 22 වැනි දින පාර්ලිමේන්තුවේදී මතු කරන ලද කරුණු වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට යොමු කිරීම සඳහා යෝජනාවක් ඉදිරිපත් කළ හැකිය."

**2. ලිපිලේඛනාදිය පිළිගැන්වීම** : (1) කථානායකතුමා විසින්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව 2015 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්ෂික වාර්තාව පිළිගන්වන ලදී.

එම වාර්තාව **සභා මේසය** මත තිබිය යුතු යැයි නියෝග කරන ලදී.

(2) උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා විසින්, 2015 වර්ෂය සඳහා ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව පිළිගන්වා, එම වාර්තාව ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(3) උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා විසින්, 2015 වර්ෂය සඳහා ශ්‍රී ලංකා නාවික හමුදාවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව පිළිගන්වා, එම වාර්තාව ජාතික ආරක්ෂාව පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(4) ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා විසින්, (203 වැනි අධිකාරය වූ) මොටර් වාහන පනතේ 164 වගන්තිය සමඟ කියවිය යුතු, එකී පනතේ 237 වගන්තිය යටතේ මෝටර් වාහන (සලකුණු, සංඥා, සංකේත හා මාර්ග ලකුණු කිරීම්) සම්බන්ධයෙන් ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2015 නොවැම්බර් 12 දිනැති අංක 1940/21 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග පිළිගන්වා, එම නියෝග ප්‍රවාහනය හා සන්නිවේදනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(5) උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා විසින්, 1968 අංක 45 දරන එක්සත් ජාතීන්ගේ පනතේ 2 වගන්තිය යටතේ 2012 අංක 02 දරන එක්සත් ජාතීන්ගේ නියෝග සංශෝධනය කරමින් විදේශ කටයුතු අමාත්‍යවරයා විසින් පනවනු ලදුව 2016 නොවැම්බර් 04 දිනැති අංක 1991/52 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග පිළිගන්වා, එම නියෝග ජාත්‍යන්තර සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(6) පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා විසින්, ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ 2015 වර්ෂයේ පැවැති 104 වැනි සැසිවාරයේදී පිළිගනු ලැබූ 204 වැනි නිර්දේශය ඇතුළත් වාර්තාව පිළිගන්වා, එම වාර්තාව අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(7) උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා විසින්—

(i) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වගන්තිය යටතේ උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යවරයා විසින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය සහිතව, කැලණිය විශ්වවිද්‍යාලයීය වෛද්‍ය පීඨයේ, වෛද්‍ය අධ්‍යාපන කේන්ද්‍රය වෛද්‍ය අධ්‍යාපන අධ්‍යනාංශය ලෙස උසස් කරමින් පනවනු ලදුව 2016 නොවැම්බර් 03 දිනැති අංක 1991/43 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(ii) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වගන්තිය යටතේ උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යවරයා විසින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය සහිතව, ශ්‍රී ලංකාවේ වයඹ විශ්වවිද්‍යාලයේ, ව්‍යාවහාරික විද්‍යා පීඨය තුළ නැනෝ තාක්ෂණ අධ්‍යයන අංශයක් පිහිටුවීම සම්බන්ධයෙන් සාදන ලදුව 2016 දෙසැම්බර් 01 දිනැති අංක 1995/25 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය; සහ

(iii) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වගන්තිය යටතේ උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යවරයා විසින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය සහිතව, ශ්‍රී ලංකාවේ රුහුණු විශ්වවිද්‍යාලයේ, වෛද්‍ය පීඨය තුළ නිර්වින්දනවේද අධ්‍යයන අංශයක් පිහිටුවීම සම්බන්ධයෙන් සාදන ලදුව 2016 දෙසැම්බර් 01 දිනැති අංක 1995/26 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය

පිළිගන්වා, එම නියමයන් අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(8) පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා විසින්, 2013 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවේ වාර්ෂික වාර්තාව පිළිගන්වා, එම වාර්තාව සෞඛ්‍යය හා මානව සුභසාධනය, සමාජ සවිබලගැන්වීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(9) පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා විසින්—

(i) 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවනු ලදුව 2016 ඔක්තෝබර් 03 දිනැති අංක 1987/8 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(ii) 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3ඇ වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවනු ලදුව 2016 නොවැම්බර් 10 දිනැති අංක 1992/30 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය; සහ

(iii) 2014 අංක 38 දරන ඉඩම් (සන්තකය පැවරීම සීමා කිරීමේ) පනතේ 3(2) වගන්තිය ප්‍රකාරව, ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතියක් වන සී/ස ඇවික් ඉන්ටනැෂනල් හොටෙල්ස් ලංකා සමාගමට කොල්ලුපිටියේ පිහිටි ඉඩමක් සින්නක්කරව පැවරීම සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2016 නොවැම්බර් 08 දිනැති අංක 1992/10 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළකරන ලද නියමය

පිළිගන්වා, එම නියමයන් රජයේ මුදල් පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(10) පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා විසින්—

(i) 2014 වර්ෂය සඳහා ජාතික ශිල්ප සභාවේ වාර්ෂික වාර්තාව; සහ

(ii) 2015 වර්ෂය සඳහා මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව සහ වාර්ෂික ගිණුම්

පිළිගන්වා, එම වාර්තා නිෂ්පාදන හා සේවා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(11) පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා විසින්—

(i) 2014 වර්ෂය සඳහා ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය, තලවාකැලේ වාර්ෂික වාර්තාව; සහ

(ii) 2014 වර්ෂය සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව

පිළිගන්වා, එම වාර්තා කෘෂිකර්මය හා ඉඩම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(12) පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා විසින්, 2015 වර්ෂය සඳහා විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව පිළිගන්වා, එම වාර්තාව බලශක්ති පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(13) පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා විසින්, 2014 වර්ෂය සඳහා ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව පිළිගන්වා, එම වාර්තාව තිරසර සංවර්ධනය හා පරිසරය සහ ස්වභාවික සම්පත් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(14) අධිකරණ අමාත්‍යතුමා සහ බුද්ධශාසන අමාත්‍යතුමා විසින්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ යුක්රේනයේ ආණ්ඩුව අතර සාපරාධී කාරණාවලදී අන්‍යෝන්‍ය නෛතික සහයෝගය ලබාදීම පිළිබඳව ඇතිකර ගනු ලැබූ ගිවිසුම සම්බන්ධයෙන් 2002 අංක 25 දරන සාපරාධී කාරණාවලදී අන්‍යෝන්‍ය සහයෝගිතාව දැක්වීමේ පනතේ 2 වගන්තිය යටතේ අධිකරණ අමාත්‍යවරයා විසින් පනවනු ලදුව 2016 නොවැම්බර් 11 දිනැති අංක 1992/78 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය පිළිගන්වා, එම නියමය නෛතික කටයුතු (දූෂණ විරෝධී) හා මාධ්‍ය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(15) පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා විසින්, 2008, 2009, 2010, 2011, 2012, 2013, 2014 සහ 2015 වර්ෂ සඳහා රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව - කොලොන්නාව කාර්ය සාධන වාර්තා පිළිගන්වා, එම වාර්තා සෞඛ්‍යය හා මානව සුභසාධනය, සමාජ සවිබලගැන්වීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(16) පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා විසින්—

(i) 2015 වර්ෂය සඳහා අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව; සහ

(ii) 2015 වර්ෂය සඳහා ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශයේ කාර්ය සාධන වාර්තාව

පිළිගන්වා, එම වාර්තා නිෂ්පාදන හා සේවා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**3. පෙත්සම් :**

(1) (i) මාතර, ඉසදීන් නගරය, මීරා පාර, අංක 99 ඒ දරන ස්ථානයෙහි පදිංචි එච්. කේ. සී. ජයමාලී මහත්මියගෙන් ලැබුණු 2016.11.30 දිනැති පෙත්සම; සහ

(ii) ත්‍රිකුණාමලය, චීන වරාය, ධාන්‍යගම, අංක එෆ් 20 දරන ස්ථානයෙහි පදිංචි ලසන්ත උඩගෙදර මහතාගෙන් ලැබුණු 2016.11.10 දිනැති පෙත්සම

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා විසින් පිළිගන්වන ලදී.

(2) (i) බඩල්ගම, බණ්ඩාරනායක මාවත, අංක 70 දරන ස්ථානයෙහි පදිංචි බී. ඒ. ඒ. විමලවීර මහතාගෙන් ලැබුණු 2016.08.23 දිනැති පෙත්සම;

(ii) මාබෝදල, මාබෝදල වත්ත, අංක 154 සී/3 දරන ස්ථානයෙහි පදිංචි ආර්. ඒ. මහින්ද රණබාහු මහතාගෙන් ලැබුණු 2016.08.23 දිනැති පෙත්සම;

(iii) කළගෙඩිහේන, සපුගස්තැන්නවත්ත, අංක 139/ඒ/32 දරන ස්ථානයෙහි පදිංචි එස්. ඒ. විජිතා කුමාරි වීරසූරිය මහත්මියගෙන් ලැබුණු 2016.08.23 දිනැති පෙත්සම; සහ

(iv) වේයන්ගොඩ, නයිවල, Y වත්ත, අංක 36 දරන ස්ථානයෙහි පදිංචි ටී. ඒ. අයිරාංගනී මහත්මියගෙන් ලැබුණු 2016.08.23 දිනැති පෙත්සම

ගරු විජිත හේරත් මහතා විසින් පිළිගන්වන ලදී.

(3) මාතර, රාහුල පාර, අංක 22/52 දරන ස්ථානයෙහි පදිංචි අනුර විතාරණ මහතාගෙන් ලැබුණු 2016.11.26 දිනැති පෙත්සම ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා විසින් පිළිගන්වන ලදී.

(4) (i) කලගෙඩිහේන, සපුගස්තැන්න, වනමල් උයන බංගලාව, අංක 136/18බී දරන ස්ථානයෙහි පදිංචි කේ. ඉනෝකා නිශාන්ති ප්‍රනාන්දු මහත්මියගෙන් ලැබුණු 2016.11.17 දිනැති පෙත්සම; සහ

(ii) මාතර, ගබඩා වීදිය, කිතුලෙවෙල පාර, මාර/මිනර්වා බෞද්ධ විද්‍යාලයේ සේවය කරන පුජා වටගෙදර රේවත හිමිගෙන් ලැබුණු 2016.11.01 දිනැති පෙත්සම

ගරු බුද්ධික පතිරණ මහතා විසින් පිළිගන්වන ලදී.

(5) (i) උලපනේ, මාවෙල පාර, අංක 107 දරන ස්ථානයෙහි පදිංචි කේ. ජී. කරුණාරත්න මහතාගෙන් ලැබුණු 2016.10.20 දිනැති පෙත්සම; සහ

(ii) බොරලැස්ගමුව, දිවුලපිටිය, ගොවිකම් පෙදෙස, අංක 219/39 දරන ස්ථානයෙහි පදිංචි එම්. ඩී. සුගතපාල මහතාගෙන් ලැබුණු 2016.11.15 දිනැති පෙත්සම

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා විසින් පිළිගන්වන ලදී.

(6) බලංගොඩ, උඩඇල්ලෙපොල, ගලබිඳපුතැන, අංක 1/446 දරන ස්ථානයෙහි පදිංචි ටී. වී. ඉන්ද්‍රානි චන්ද්‍රිකා මහත්මියගෙන් ලැබුණු 2016.11.14 දිනැති පෙත්සම ගරු හේෂාන් විතානගේ මහතා විසින් පිළිගන්වන ලදී.

(7) (i) ගාල්ල, බණ්ඩාරනායක පෙදෙස, අංක 181 දරන ස්ථානයෙහි පදිංචි ගුණපාල විතාරණ මහතාගෙන් ලැබුණු 2016.11.10 දිනැති පෙත්සම; සහ

(ii) වලස්මුල්ල පොලිස් ස්ථානයේ පොලිස් පරීක්ෂක ඩබ්ලිව්. සී. ඉන්ද්‍රජිත් ද සිල්වා මහතාගෙන් ලැබුණු 2016.09.09 දිනැති පෙත්සම

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා විසින් පිළිගන්වන ලදී.

අංක 25අ දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ එම පෙත්සම්, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කරන ලදී.

**4. ශ්‍රී ලංකා තිරසාර සංවර්ධන :** අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව,— ශ්‍රී ලංකාව තුළ තිරසාර සංවර්ධනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් හා උපාය මාර්ගයක් සංවර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා ද; තිරසාර සංවර්ධන සභාවක් පිහිටුවීම සඳහා ද; ඊට සම්බන්ධ හා ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනත් කෙටුම්පතකි.

පනත් කෙටුම්පත 2017 ජනවාරි මස 24 වැනි අඟහරුවාදා දෙවැනිවර කියවිය යුතුයැයි ද, එය මුද්‍රණය කළ යුතුයැයි ද, එම පනත් කෙටුම්පත අදාළ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමුකළ යුතුයැයිද නියෝග කරන ලදී.

කථානායකතුමා විසින් මතු පළවන නිවේදනය කරන ලදී:—

"පාර්ලිමේන්තුවට අද දින පිළිගන්වන ලද "ශ්‍රී ලංකා තිරසාර සංවර්ධන" නමැති පනත් කෙටුම්පතෙහි විධිවිධාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154උ (5) (අ) ව්‍යවස්ථාවට යටත් වන බව නීතිපතිතුමා විසින් ප්‍රකාශ කර ඇති අතර, ඊට අනුකූලව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 46අ (2) (අ) යටතේ ඒ ඒ පළාත් සභාවට අදාළ පනත් කෙටුම්පත යොමු කොට එම යොමු කිරීමේ දින සිට එක් මසක කාලසීමාවක් ඇතුළත එකී පනත් කෙටුම්පත

සම්බන්ධයෙන් එහි අදහස් පාර්ලිමේන්තුවට වාර්තා කිරීම සඳහා එකී පනත් කෙටුම්පතේ පිටපත් එක් එක් පළාත් සභාවට ඉදිරිපත් කරන ලෙස පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයාට මම නියෝග කරමි.''

**5. පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 1) :** පාර්ලිමේන්තුවේ සභානායකතුමා ඉදිරිපත් කළ යෝජනාව,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 7 හි විධිවිධානවල සහ 2016.03.08 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවල කුමක් සඳහන් වුවද, 2017 ජනවාරි මස 24 වැනි අඟහරුවාදා, 25 වැනි බදාදා, 26 වැනි බ්‍රහස්පතින්දා සහ 27 වැනි සිකුරාදා පාර්ලිමේන්තුව රැස්වන දිනයන් විය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**6. පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 2) :** පාර්ලිමේන්තුවේ සභානායකතුමා ඉදිරිපත් කළ යෝජනාව,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 7 හි විධිවිධානවල සහ 2016.03.08 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවල කුමක් සඳහන් වුවද, 2017 ජනවාරි මස 24 වැනි අඟහරුවාදා දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ. භා. 9.30 සිට අ. භා. 6.30 දක්වා විය යුතු ය. පූ. භා. 10.30 ට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 7(5) ක්‍රියාත්මක විය යුතු ය. අ. භා. 6.30 ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**7. පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 3) :** පාර්ලිමේන්තුවේ සභානායකතුමා ඉදිරිපත් කළ යෝජනාව,— අද දින විසිර යෑමේදී මෙම පාර්ලිමේන්තුව 2017 ජනවාරි මස 24 වැනි අඟහරුවාදා පූ. භා. 9.30 වන තෙක් කල් තැබිය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**8. කල් තැබීම :** ''මෙම පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය''යි පාර්ලිමේන්තුවේ සභානායකතුමා යෝජනා කළේය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය; පූ. භා. 10.40 ට, අද දින සභා සම්මතිය අනුව, 2017 ජනවාරි 24 වන අඟහරුවාදා පූ. භා. 9.30 වන තෙක් පාර්ලිමේන්තුව කල් ගියේය.